මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2015

Primary Piriven Year End Term Test - 2015

5 වසර / Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

ත්‍රිපිටක ධර්මය I
Thripitaka Dharmaya I

කාලය : පැය තුනයි
Time : Three hours

**I** කොටසේ ප්‍රශ්න **සියල්ලටම** ද **II , III** යන කොටස්වලින් ප්‍රශ්න **දෙකක්** බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න **හතරකට** ද පිළිතුරු සපයන්න.

## I කොටස

01. **පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. අෂ්ට විද්‍යාවලින් **හතරක්** නම් කරන්න.

ii. ''යමක මහා ප්‍රතිහාර්යය'' යනු කුමක්ද?

iii. දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණවලින් **හතරක්** නම් කරන්න.

iv. ඛේමා භික්‍ෂුණිය ලද අගතනතුරු **දෙක** මොනවාද?

v. සරණංකර මාහිමියන් උපන් ග්‍රාමය හා උපන් වර්ෂය ලියන්න.

vi. අගසව් දෙනමගේ මව් පියන්ගේ නම් **හතර** වෙන වෙනම ලියන්න.

vii. ව්‍යග්සපජ්ජ සූත්‍රයේ එන පරලොව දියුණුවට හේතුවන කාරණා **හතර** නම් කරන්න.

viii. පරාභව සූත්‍රයට අනුව පිරිහීමේ කරුණු **හතර** ක් නම් කරන්න.

ix. ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පහළොවෙන් **හතර** ක් නම් කරන්න.

x. මහා සංඝික නිකාය බෙදී ගිය කොටස් **හතරක්** නම් කරන්න.

(ලකුණු 4 x 10 = 40)

## II කොටස

02. i. බුදුරජාණන් වහන්සේ පිහිට වූ අසරණයන් **හතර** දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

ii. බුදුරජාණන් වහන්සේ ඉන් එක් අයෙකුට පිහිට වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

iii. බුදුරාජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය පැහැදිලි කරන්න. (ලකුණු 07)

03. i. **''භද්‍රොපි පස්සති පාපං - යාව පාපං න පච්චති''** මෙම ගාථා පාඨයෙන් උගන්වන ධර්ම කරුණු පහදන්න.

ii. කාලාම සූත්‍රයේ යමක් නොපිළිගත යුතු ආකාර දහයක් සඳහන් කර ඇත. ඉන් **හයක්** ලියා දක්වන්න.

iii. ආර්ය විනයට අනුව **සදිසා** නම් කරන්න.

iv. සිගාලෝවාද සූත්‍රයට අනුව **සතර අගතිය** නම් කරන්න.

v. සැරියුත් මහ රහතන් වහන්සේ පිළිබඳ ගුණ කථනයක් කළ තෙරණුවන් නම් කර උන්වහන්සේ පෙන්වාදුන් ගුණ **තුනක්** ලියන්න. (ලකුණු 3 x 5 = 15)

*04.* *පහත සඳහන් ගාථා සම්පූර්ණ කොට ඒවායෙහි අර්ථය ලියා දක්වන්න.*

i. වෙදනං එරුසං ජානිං ......................................................

ii. ගබ්භමෙකෙ උප්පජ්ජන්ති ......................................................

iii. යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ ...................................................... (ලකුණු 3 x 5 = 15)

05. ''ගිහි පැවිදි දෙපක්ෂයේ අන්‍යොන්‍ය සම්බන්ධය සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීමට බලපායි'' **සිගාලෝවාද සූත්‍රය** ඇසුරින් විමසන්න. (ලකුණු 15)

## III කොටස

06. i තුන්වන ධර්ම සංගායනාවෙන් පසු එහි ප්‍රතිඵල වශයෙන් ධර්ම දූතපිරිස් යැවූ රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 4)

ii ධර්ම දූතයන් වහන්සේලා ලක්දිවට වැඩමවීමේ ඓතිහාසික සිදුවීම පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 4)

iii ලක්දිව භික්ෂු සාසනයේ ආරම්භය හා ව්‍යාප්තිය පැහැදිලි කරන්න. (ලකුණු 7)

07. i සිගාලෝවාද සූත්‍රයේ සඳහන් මිත්‍ර ප්‍රතිරූපකයන් සිව්දෙනා දක්වන්න. (ලකුණු 4)

ii කාලාම සූත්‍රයේ එන **''මා අනුස්සවෙන''** යන පදය විවරණය කරන්න. (ලකුණු 4)

iii ''සූත්‍ර ධර්ම ඇසුරෙන් සමාජයට ඉදිරිපත්වන ජීවන දර්ශනය පුද්ගල ජීවිතයෙහි දොලොව යහපත උදා කරයි'' අදාළ සූත්‍ර ඇසුරෙන් විමසන්න. (ලකුණු 7)

08. නූතන භික්ෂු ජීවිතය සංවර්ධනය කර ගැනීම සඳහා අග්‍රශ්‍රාවක චරිත ඉවහල් කර ගත හැකි අයුරු විස්තර කරන්න. (ලකුණු 15)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2015

## Primary Piriven Year End Term Test - 2015

5 වසර / Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved)

**ත්‍රිපිටක ධර්මය II** — කාලය : පැය තුනයි

**Thripitaka Dharmaya II** — Time : Three hours

**I** කොටසේ ප්‍රශ්න **සියල්ලටම ද II , III** හා **IV** යන කොටස්වලින් යටත් පිරිසෙයින් එක් කොටසකින් එක ප්‍රශ්නයක්වත් අයත් වන සේ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

01 **පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1 අධිශීල ශික්ෂාව සම්පූර්ණ කළයුතු ආකාර **හතර** දක්වන්න.

2. භික්ෂු විනයෙහි සඳහන් ගරු ඇවැත් නම් කරන්න.

3. ආපත්තිහු ප්‍රතිකර්ම කළ හැකි - නොහැකි ආකාර අනුව ප්‍රභේද කීයද? ඒවා නම් කරන්න.

4. දුක පිළිබඳ අර්ථ **හතර** නම් කරන්න.

5. ලෝකෝත්තර ඵල සිත් **හතර** ලියන්න.

6. සතර කමටහන් නම් කරන්න.

7. ලක්ඛණ රූප නම් කරන්න.

8. සත්වයාගේ උප්පත්ති වර්ග **හතර** නම් කරන්න.

9. බුද්ධ කාලීන පරිබ්‍රාජකයන් ඉගැන්වූ තපස්වත් **හතරක්** ලියන්න.

10. රහතන් වහන්සේගේ ස්වභාවය හඳුන්වන පද **හතරක්** ලියන්න. (ලකුණු 4 x 10 = 40)

### II කොටස

2. i **යො පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා.....** යන පාරාජිකා පාඨය සම්පූර්ණ කරන්න. (ලකුණු 05)

ii. ඉහත සඳහන් පාඨයෙහි අදහස ලියන්න. (ලකුණු 05)

iii. ඉහත සඳහන් වන විනය ප්‍රඥප්තිය පැනවීමට හේතු වූ නිදාන කතාව ලියා දක්වන්න. (ලකුණු 05)

3. i . පහත සඳහන් මාතෘකා තුනකට කෙටි සටහන් ලියන්න.

ii. i සංඝාදිසේස ii ආපත්ති ආරෝචනය iii සතර පාරාජිකා iv අනියත
v සේඛියා (ලකුණු 3 x 5 =15)

## III කොටස

4. i **''උප්පාදො පඤ්ඤායති, වයෝ පඤ්ඤායති ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති''** යන පාඨය පැහැදිලි කරන්න. (ලකුණු 05)

   ii කර්මය හා පුනර්භවය අතර සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 05)

   iii ''පංචනියාම ධර්ම මත ලෝකය රඳා පවතී.'' මෙම ප්‍රකාශය සහේතුකව පහදන්න. (ලකුණු 05)

5. i දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

   ii ආර්ය ශ්‍රාවකයෙකු විසින් අත්හළ යුතු අන්ත දෙක පැහැදිලි කරන්න. (ලකුණු 05)

   iii ''නිර්වාණය අවේදයිත සැපයකි'' විස්තර කරන්න. (ලකුණු 05)

## IV කොටස

6. i මහාභූත රූප පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

   ii **''රුප්පතීති භවෙ රූපං - විකාර පච්චයෙ සති''** පැහැදිලි කරන්න. (ලකුණු 05)

   iii රූප උපදවන හේතු විස්තර කරන්න. (ලකුණු 05)

7. i පහත සඳහන් මාතෘකාවලින් තුනකට කෙටි සටහන් ලියන්න.

   i විදර්ශනා භාවනාව ii පංච නීවරණ

   iii කෙලෙස් ප්‍රහාණය iv අභිඤ්ඤා (ලකුණු 3 x 5 =15)

8. i සමථ භාවනාවෙන් කෙලෙස් යටපත් වන ආකාරය හා සමථ භාවනාවේ ප්‍රතිඵල පැහැදිලි කරන්න.

**නැතහොත්**

**''සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤො - චිත්තං පඤ්ඤංච භාවයන්''** යන්න විස්තර කරන්න

(ලකුණු 15)